| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023.09.14 |

# සේවක අර්ථසාධක අරමුදල දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට සහභාගීවීම

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තු අනුමැතිය මත සිදු කරන ලද දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට සුදුසුකම් සැපිරූ භාණ්ඩාගාර බැඳුම්කර හිමිකරුවෙක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) අදාළ භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව සඳහා සහභාගී වූ බව එහි සාමාජිකයින් වෙත මෙයින් දැනුම්දෙමු.

ඒ සම්බන්ධ පහත කරුණු පිළිබඳව සේ.අ.අ. හි සාමාජිකයින් දැනුම්වත් කරනු ලැබේ.

අ. 2023 ජුලි 01 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ දේශීය රාජ්‍ය ණය ප්‍රශස්තකරණය සම්බන්ධව රජයේ ප්‍රතිපත්තිය පිළිබඳ යෝජනාව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 ජුලි 04 වන දින නිවේදනය කරන ලදී.

ආ. එම නිවේදනයෙහි සඳහන් කරුණු අනුව, භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර විශ්‍රාම අරමුදල් ලබන ආදායම මත පනවන ලද 30%ක සැලකිය යුතු ඉහළ ආදායම් බදු අනුපාතිකයක් ගෙවීමෙන් වැළකීම සඳහා එම විශ්‍රාම අරමුදල්හි දැනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර, නව භාණ්ඩාගාර බැඳුම්කරවලට හුවමාරු කිරීම සිදු කළ යුතු බව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් සඳහන් කර ඇත. 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට අනුව, මෙම බද්ද 2023 ඔක්තෝබර් 01 වන දින සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත. වර්තමානයේදී, භාණ්ඩාගාර බැඳුම්කර ආදායම ඇතුළුව සේ.අ.අ. හි ආදායම සඳහා අදාළ වන බදු අනුපාතිකය 14% ක් වන අතර, මෙම සහනදායී අනුපාතිකය යටතේ බදු ගෙවීම, 2023 සැප්තැම්බර් 30 වන දින සිට අඛණ්ඩව පවත්වා ගෙන යෑම සඳහා, සේ.අ.අ., දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට සහභාගී විය යුතු විය.

ඇ. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 ජුලි 04 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන හුවමාරු යෝජනාව සහ පසුකාලීනව එයට කරන ලද සංශෝධනයන්හි, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කිරීම සම්බන්ධයෙන් වන සම්පූර්ණ තොරතුරු ඇතුළත් විය. තවද, එම අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු කිරීමේ ක්‍රියාවලිය සහ එහි බලපෑම් පිළිබඳ විස්තර දක්වමින්, 2023 ජුලි 07 වන දින ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබූ අතර, මෙම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පැන නැඟුන ගැටලු සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම්ද සහිත සටහනක් පසුව නිකුත් කරන ලදී. මෙම භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන හුවමාරු යෝජනාවට අනුව, සුදුසුකම් සැපිරූ භාණ්ඩාගාර බැඳුම්කර

හිමිකරුවන් විසින් තම බැඳුම්කර හුවමාරු කිරීම/නොකිරීම යන තීරණයට එළඹීම සඳහා දේශීය ණය ප්‍රශස්තකරණයෙහි; නීතිමය, බදු, මූල්‍ය, නියාමන, ගිණුම්කරණය යන පැතිකඩ පිළිබඳව පුළුල් විශ්ලේෂණයක් කළ යුතු වේ. මේ සම්බන්ධ සියලුම නිවේදන https://treasury.gov.lk/web/ddo සබැඳියෙන් ලබාගත හැකිය.

ඈ. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදේශනය මත මුදල් අමාත්‍යාංශය විසින් පිළියෙළ කරන ලද "ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණය" යන මාතෘකාව යටතේ වන ඉදිරිපත් කිරීමක්, 2023 ජුනි 28 වන දින අමාත්‍ය මණ්ඩලයට සිදු කරන ලදී. තවද, 2023 ජුනි 29 සහ ජුනි 30 යන දෙදින තුළ, දේශීය ණය ප්‍රශස්තකරණයෙන් සේ.අ.අ. මත ඇති විය හැකි බලපෑම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහි මුදල් කාරක සභාව දැනුම්වත් කළ අතර, අනතුරුව ඒ පිළිබඳව පුළුල්ව සාකච්ඡා කරන ලදී. තවද, දේශීය ආදායම් පනතට සිදු කිරීමට යෝජිත සංශෝධන මඟින් විශ්‍රාම අරමුදල්වලට වන බලපෑම පිළිබඳව මෙම සභාව, 2023 සැප්තැම්බර් 07 වන දින පවත්වන ලද රැස්වීමේදී ද සාකච්ඡා කරන ලදී.


ඉ. හුවමාරු සංදේශයෙහි සඳහන් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහනට අනුව, සේ.අ.අ. සඳහා පහත සඳහන් විකල්ප අවස්ථාවන් දෙක පැවතිණි.

i. **බැඳුම්කර හුවමාරු කිරීමේ අවස්ථාව:** සේ.අ.අ. හි දැනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර කළඹින් නිශ්චිත අවම ප්‍රමාණය 2027 සිට 2038 දක්වා කාලය තුළ කල් පිරෙන නව භාණ්ඩාගාර බැඳුම්කර 12ක් සමඟ හුවමාරු කළ හැකිය. මෙම නව බැඳුම්කරවල කූපන් පොලී අනුපාතිකය 2026 වසර තෙක් වසරකට 12%ක් සහ ඉන් අනතුරුව වසරකට 9%ක් වේ. එහිදී සේ.අ.අ. භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජනයෙන් උපයන ආදායම සඳහා දැනට ගෙවනු ලබන 14%ක ආදායම් බද්ද අඛණ්ඩව ඉදිරියට ද ගෙවිය හැකිය.

ii. **බැඳුම්කර හුවමාරු නොකිරීමේ අවස්ථාව:** සේ.අ.අ. දැනට පවතින භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරු නොකිරීමට තීරණය කරන්නේ නම්, භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන මඟින් උපයන ආදායම 30%ක බදු අනුපාතිකයකට යටත් වේ.

ඊ. මුදල් මණ්ඩලය විසින් දේශීය ණය ප්‍රශස්තකරණ කිරීමේ වැඩසටහන යටතේ ඇති ඉහත සඳහන් විකල්ප අවස්ථා දෙක මඟින් සේ.අ.අ. ට ඇති විය හැකි බලපෑම පිළිබඳව පුළුල්ව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව, දේශීය ණය ප්‍රශස්තකරණය කිරීමේ වැඩසටහන මඟින් අරමුදලට ඇති විය හැකි බලපෑම පිළිබඳව මුදල් මණ්ඩලයට පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට සහය දක්වමින්, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අභ්‍යන්තර කාර්යය මණ්ඩලය විසින් විශ්ලේෂණ කිහිපයක් සිදු කරන ලදී. එම විශ්ලේෂණයන් සිදු කිරීමේදී විචක්ෂණශීලී සහ තාත්වික උපකල්පන කිහිපයක් මත පදනම්ව, දේශීය ණය ප්‍රශස්තකරණයෙහි නීතිමය, බදු, මූල්‍ය, නියාමන සහ ගිණුම්කරණ යන අංශයන්ගෙන් ඇතිවිය හැකි බලපෑමද සැලකිල්ලට ගෙන ඇත. මෙම අවස්ථාවන් දෙක යටතේ භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි අපේක්ෂිත ප්‍රතිලාභවල සාරාංශයක් පහත රූපසටහන මඟින් දක්වා ඇත. වර්තමානයේදී අරමුදලින් 88% ප්‍රමාණයක් භාණ්ඩාගාර බැඳුම්කර කළඹ

මඟින් නිරූපණය වන අතර, ඉතිරියෙන් වැඩි ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. භාණ්ඩාගාර බිල්පත් සහ අලුතින් එක්වන අරමුදල් පවතින වෙළඳපොළ පොලී අනුපාතික යටතේ ආයෝජනය කිරීම තුළින් පහත රූප සටහනෙහි දැක්වෙන භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන විකල්ප අවස්ථා දෙක මඟින් ජනිත වන ප්‍රතිලාභයන්ට වඩා ඉහළ ප්‍රතිලාභයක් ඉපයිය හැකි වනු ඇත.




සටහන : ඉහත රූප සටහනෙහි දක්වා ඇති සංඛ්‍යා, අදාළ ගණනය කිරීම් සිදු කරන අවස්ථාවේ පැවැති සාධාරණ තොරතුරු සහ කරුණු මත පදනම් වූ උපකල්පන සහ පුරෝකථන මත පදනම්ව ගණනය කර ඇත. මෙහිදී සලකනු ලැබූ උපකල්පන සහ පුරෝකතන සහ අදාළ බදු අනුපාතිකයන් එලෙසම නොපවතින අවස්ථාවන් උදාවිය හැකි අතර එහි ප්‍රතිඵලයක් ලෙස, ඉදිරිපත් කර ඇති පුරෝකථන සහ ප්‍රතිඵල වෙනස් වීමකට ලක් විය හැකිය. රූප සටහනෙහි පෙන්වා දී නොමැති නමුත්, අපේක්ෂිත අනාගත පොලී අනුපාතිකවල වෙනස්කම් සිදු වීම පිළිබඳ උපකල්පන වෙනස් කර, ලැබිය හැකි ප්‍රතිඵල පරීක්ෂා කරන ලද අතර, එහිදී තහවුරු වූයේ අවස්ථා දෙක මඟින් පෙන්වන සංසන්දනාත්මක රටාවන්හී සැලකිය යුතු තරම් වෙනසක් සිදු නොවන බවයි.

උ. භාණ්ඩාගාර බැඳුම්කර කළඹ සඳහා ඉහත සඳහන් වාර්ෂික ප්‍රතිලාභ අනුපාතිකයන් ගණනය කිරීමේදී සලකා බලනු ලැබූ ප්‍රධාන සාධක සහ උපකල්පන පහත දක්වා ඇත.

i. සේ.අ.අ. හි භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි මුහුණත අගය රුපියල් බිලියන 3,220කි. අවම සහභාගීත්ව අවශ්‍යතාව සපුරාලීම සඳහා සේ.අ.අ. හි භාණ්ඩාගාර බැඳුම්කර කළඹෙහි මුහුණත අගයෙන් 78%ක් වත් හුවමාරු කළ යුතු වේ.

ii. ණය හුවමාරුව යටතේ නිකුත් කරන ලද නව භාණ්ඩාගාර බැඳුම්කරද ඇතුළුව සියලුම භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළ ගෙවීම් රජය විසින් අදාළ දිනයන්හී දී නිසි පරිදි සේවාකරණය කරනු ඇත.

iii. භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම් සහ කූපන්පත්වලට අදාළ මුදල් ලැබීම් 2023 වර්ෂය සඳහා 13.5%, 2024 වර්ෂය සඳහා 12%, 2025 වර්ෂය සඳහා 10.5% සහ 2026 වර්ෂයේ සිට ඉදිරියට

10% පොලී අනුපාතිකයන් යටතේ වසර 6 ක කල් පිරෙන භාණ්ඩාගාර බැඳුම්කරවල නැවත ආයෝජනය කෙරේ (විවිධ ප්‍රතිආයෝජන අනුපාත තත්ත්වයන් යටතේ අපේක්ෂිත ප්‍රතිලාභ ගණනය කරන ලද අතර, එහිදී තහවුරු වූයේ අදාළ ප්‍රතිලාභ රටාව නොවෙනස් වන බවයි).

iv. සේ.අ.අ. භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී වන්නේ නම්, වර්තමාන බදු අනුපාතිකය වන 14% ඉදිරියටද නොවෙනස්ව පවතිනු ඇත. කෙසේ වෙතත්, සේ.අ.අ. භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී නොවන්නේ නම්, භාණ්ඩාගාර බැඳුම්කරවල ආදායම මත අදාළ වන බදු අනුපාතිකය 30%ක් දක්වා ඉහළ යනු ඇත. එය භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී වුවහොත් අදාළ වන බදු අනුපාතිකය මෙන් දෙගුණයකට වැඩිය. මෙම බදු අනුපාතික 2038 තෙක් නොවෙනස්ව පවතිනු ඇත.

ඍ. මනා විශ්ලේෂණයකින් සහ ඉහත දක්වා ඇති දිරිගන්වන සුළු සාධක ද සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, සේ.අ.අ.ට, පුරෝකථනය කළ හැකි නුදුරු අනාගතය තුළ, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවෙන් ද්‍රවශීලතා ගැටලු ඇති නොවන බවද, දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති සාමාජික ගිණුම්වල ශේෂයන් අඩු නොවන බවටද මුදල් මණ්ඩලය තහවුරු කර ගන්නා ලදී. තවද, 1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ 14 වන වගන්තියට සංශෝධනයක් සිදු කරමින් සේ.අ.අ. දායක මුදල් සඳහා 2023 සිට 2026 දක්වා කාලය සඳහා (එකී වර්ෂයන් 02 ද ඇතුළත්ව) සාමාජික ප්‍රතිලාභ ලෙස වාර්ෂිකව අවම වශයෙන් 9% ක පොලී ප්‍රතිලාභයක් ගෙවිය යුතු බවට නෛතික සංශෝධන ගෙන ඒමට 2023 වර්ෂයේ අගෝස්තු 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමත විය.

එ. ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල් සහ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සමඟ දේශීය ණය ප්‍රශස්තකරණයෙන් සේ.අ.අ.ට සිදුවිය හැකි බලපෑම පිළිබඳව, දැනුම්වත් කිරීම සඳහා රැස්වීමක් පැවති අතර, එම රැස්වීමේ දී සිදු කරන ලද සාකච්ඡාවන්ට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී වීම, එයට සහභාගී නොවීමේ විකල්පයට සාපේක්ෂව වැඩි වාසි සහගත බව ඒකමතිකව පිළිගන්නා ලදී.

ඒ. මහ බැංකු අධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් යුතුව, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, වෘත්තීය සමිති කිහිපයක නියෝජිතයින් සමඟ දේශීය ණය ප්‍රශස්තකරණය සම්බන්ධයෙන් ඔවුන් වෙත පැවති ගැටලු පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලද අතර, ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

දේශීය ණය ප්‍රශස්තකරණය යටතේ භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව සඳහා සේ.අ.අ. සහභාගී වීම පිළිබඳව තීරණය ගැනීමේ දී සැලකිල්ලට ගනු ලැබූ සාධක සහ අනෙකුත් කරුණු පිළිබඳව සේ.අ.අ. සාමාජිකයින්ට දැනුම් දීම සඳහා ඉහත තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.

දූරදර්ශී සහ යථාර්ථවාදී උපකල්පන මත පදනම්ව සිදු කර ඇති ගණනය කිරීම් සලකා බැලීමෙන් අනතුරුව, පවත්නා විකල්ප දෙක අතුරින් භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව සඳහා සහභාගී වීම වඩාත් හොඳ විකල්පය වන බව මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. තවද, යෝජිත භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව සහ රජය විසින් ක්‍රියාවට නංවමින් පවතින අනෙකුත් ප්‍රතිසංස්කරණ වැඩසටහන් සමඟ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ස්ථාපිත වනු ඇතැයිද, එමඟින් ණය සේවාකරණ හැකියාව ප්‍රතිෂ්ඨාපනය වනු ඇතැයිද මුදල් මණ්ඩලයේ අදහසයි. තවද, අනවශ්‍ය කාල පමාවකින් තොරව රාජ්‍ය ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය නොවුණහොත් භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට පෙර සේ.අ.අ. සතුව පැවති බැඳුම්කර, පූර්ණ ලෙස සේවාකරණය කිරීමේ හැකියාව රජයට නොමැති වීමේ අවදානමක් පවතින බවත්, එමඟින් සේ.අ.අ. වඩාත් දැඩි අහිතකර ප්‍රතිවිපාකයන්ට ලක්විය හැකි බවත්, මුදල් මණ්ඩලයේ අදහස විය. එබැවින්, සේ.අ.අ.හි වත්කම්වලින් විශාල කොටසක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර ඇති නිසා, පැවති විකල්ප දෙක අතුරින්, භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුව සඳහා සහභාගී වීම සේ.අ.අ.හි මතු අභිවෘද්ධිය සඳහා හේතු වනු ඇත. භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී වීම තුළින්, පුරෝකථනය කළ හැකි නුදුරු අනාගතය තුළදී සේ.අ.අ. සාමාජිකයින් සඳහා අවම වශයෙන් 9% පොලී අනුපාතිකයක් ලබාදීමට හැකි වන අතර, ප්‍රකාශිත සාමාජික ශේෂයන් අඩු නොවන බවද මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය.

අවසාන වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, සේවක අර්ථසාධක අරමුදලෙහි භාරකරු වශයෙන් දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ පවත්නා විකල්ප දෙක සලකා බලා දිගුකාලීන දැක්මක් ඇතුව අරමුදලෙහි සාමාජිකයින් හට වඩාත් ඵලදායී විකල්පය වන භාණ්ඩාගාර බැඳුම්කර හුවමාරුවට සහභාගී විය. ඒ අනුව, සේ.අ.අ. විසින් අවම සහභාගී අවශ්‍යතාවයට අතිරේකව, එහි සංසන්දනාත්මක ප්‍රතිලාභ සලකා බලා රු.149,890,740,000 ක මුහුණත අගයක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර ද ඇතුළුව, සමස්තයක් වශයෙන් රු.2,667,512,169,237ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර, හුවමාරුවට ඉදිරිපත් කරන ලදී. සේ.අ.අ. විසින් හුවමාරු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සියලුම භාණ්ඩාගාර බැඳුම්කර රජය විසින් පිළිගන්නා ලද අතර, එහි මුහුණත අගයට සමාන වටිනාකමක් ඇති නව භාණ්ඩාගාර බැඳුම්කර සේ.අ.අ. වෙත නිකුත් කරන ලදී.